**අක්මීමන ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**

----------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 අගෝස්තු 07 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 18 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට අක්මීමන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) දේශීය ණය හා සංවර්ධන අරමුදලෙන් ලබාගෙන තිබූ රු.8,643,077 ක් වූ ණය මුදල් ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) 2016 ජනවාරි 01 සිට පෙබරවාරි 12 දින දක්වා කාලය තුළ දරා තිබුණු එකතුව රු.1,087,719 ක් වූ වියදම් පමණක් සමාලෝචිත වර්ෂයේ ණයහිමියන් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසානයට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු එකතුව රු.3,072,087 ක් වූ දායක මුදල ගිණුම් ගතකර නොතිබුණි.

### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.21,241,687 ක් වූ ගිණුම් විෂයයන් 10 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර එකතුව රු.7,718,375 ක අසමානතා විය.

(ආ) ගෙවල් කුලී තැන්පතු රු.7,960 කින් හා ටෙන්ඩර් තැන්පතු රු.138,330 කින් අඩුකර, විවිධ තැන්පතු රු.6,113,795 කින් වැඩිකර සාවද්‍ය ලෙස ගැලපීම් කර, පොදු තැන්පත් ලේඛනයේ ශේෂය හා මූල්‍ය ප්‍රකාශනවල ශේෂය එකිනෙක තුළනය කර තිබුණි.

### 1.3.4 අවිනිශ්චිත ගිණුම

ඉකුත් වර්ෂයේ අවසානයට රු.4,000 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂයට අදාළ ගැලපීම් කර ගිණුම් නිරවුල් නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට එම ගිණුමේ ශේෂය රු.5,600 ක් දක්වා වැඩි වී තිබුණි.

### 1.3.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයටත් පෙර සිට ඉදිරියට ගෙනෙමින් පවතින රු.305,381 ක මුද්දර ගාස්තු හා රු.677,360 ක උසාවි දඩ මුදල් ශේෂ, රු.165,000 ක වීථි පහන් නඩත්තු ප්‍රතිපූර්ණ ලෙස ලැබිය යුතු ශේෂය සහ සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.58,629,346 ක් වූ ණයගැති ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2008 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙනෙමින් පවතින රු.398,175 ක් වූ විවිධ ණයහිමි ශේෂ සහ 2011 සිට 2014 දක්වා වූ රු.232,824 ක විගණන ගාස්තු නිරවුල් කිරීමට කටයුතු සමාලෝචිත වර්ෂයේ දීත් කටයුතු කර නොතිබුණි.

### 1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු. 19,689,715 ක් වූ මෝටර් රථ හා කරත්ත සම්බන්ධයෙන් වාහන උපලේඛනය ද, එකතුව රු. 8,643,077 ක් වූ දේශීය ණය හා සංවර්ධන අරමුදලේ ණය පිළිබඳ ගොනු, ගිවිසුම් සහ ශේෂ සනාථ ද, එකතුව රු.145,725 ක් වූ අයකර ගතහැකි උපයෝගි සේවා අත්තිකාරම් ද, එකතුව රු.1,386,500 ක් වූ සභාවේ පෙර ගෙවුම් සහ එකතුව රු.7,925,555 ක් වූ පොදු තැන්පත් සම්බන්ධයෙන් උපලේඛන ද, යනාදී සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා විගණනයේ දී එම ගනුදෙනු සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

### 1.3.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත විස්තර දැක්වෙන නීති, රීති, සහ රෙගුලාසි විධිවිධාන වලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| **ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මු.රෙ 371(2)(ආ) සහ (ඇ) | 1997 සිට 2009 දක්වා කාලය තුළ අවස්ථා 23 කදී පුද්ගලයින් 06 දෙනෙකුට ලබා දී තිබුණු එකතුව රු.301,500 ක අත්තිකාරම් නිරවුල් කර ගෙන නොතිබුණි. |
| (ii) මු.රෙ.1645 සහ1646 | සභාවට අයත් වාහන 17 ක් වෙනුවෙන් දෛනික ධාවන සටහන්පත් හා මාසික කාර්ය සාධන සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

.

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.17,942,266 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.3,454,571 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.14,487,695 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

(ආ) වැඩසටහන් අනුව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ආදායම් හා වියදම් සසඳා බැලීමේ දී වැඩසටහන් හතරක ආදායම ඉක්මවා ගිය වියදම් දක්නට ලැබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව රු.16,000,000 ක ප්‍රාග්ධන ආදායම් සහ රු.29,750,000 ක ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු කර තිබුණි. කෙසේ වුවද, ප්‍රාග්ධන ආදායම් ඉක්ම වූ වියදම් සම්බන්ධයෙන් අරමුදල් සපයා ගන්නා ආකාරය පැහැදිලි නොකෙරුණි. තථ්‍ය ප්‍රාග්ධන ආදායම රු.4,502,519 ක් හා තථ්‍ය ප්‍රාග්ධන වියදම රු.8,673,473 ක් වීමෙන් ප්‍රාග්ධන ආදායම ඉක්මවා රු.4,170,954 ක ප්‍රාග්ධන වියදම් දරා තිබුණි.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

ඉකුත් වර්ෂයට සාපේක්ෂව ආදායම් ආධාර ලැබීමේ ප්‍රතිශතය වැඩි වී තිබුණු අතර, එය පුනරාවර්තන වියදමට සාපේක්ෂව පුනරාවර්තන ආදායමේ වැඩිවීමට ඍජුව බලපා තිබුණි. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | පුනරාවර්තන මුළු ආදායම් | ආදායම් ආධාර | ස්වයං උත්පාදන ආදායම් | මුළු පුනරාවර්තන වියදම | ස්වයං උත්පාදන ආදායම් ඉක්මවා ගිය පුනරාවර්තන වියදම |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| 2015 | 64,089,142 | 28,030,220 | 36,058,922 | 46,146,875 | 10,087,953 |
| 2014 | 48,990,701 | 15,318,434 | 33,672,267 | 45,536,129 | 11,863,862 |
| 2013 | 42,199,592 | 12,587,511 | 29,612,081 | 39,581,906 | 9,969,825 |

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සැම වර්ෂයකම සභාවේ ස්වයං උත්පාදන ආදායම් වල මෙන්ම ආදායම් ආධාර ලැබීම් වල වර්ධනයක් පෙන්නුම් කල නමුත්, සභාවේ පුනරාවර්තන වියදම් අඛණ්ඩව වැඩිවන වේගයකින් වැඩි වී තිබුණි.

(ii) ආදායම් ආධාර නොලැබෙන්නට සභාවේ ආදායම් වලින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට කිසිදු ආකාරයකින් හැකියාවක් නොලැබෙන බව පෙන්නුම් කළ ද, පුනරාවර්තන වියදම් අවම කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 වරිපනම් බදු සහ අක්කර බදු

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ වලට අදාළව අය කරගත යුතුව තිබුණු රු.7,852,917 ක් වූ මුදලින් අය කරගෙන තිබුණේ රු.2,516,614 ක් හෙවත් සියයට 32 ක් තරම් පහළ අගයකි. එම හේතුව නිසා හිඟය වර්ෂය අවසානයට රු.5,336,303 ක් දක්වා වර්ධනය වී තිබුණි.

හිඟ ආදායම් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) සහ 159(1) යන ඡේද වල දැක්වෙන විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂ සහ සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.330,857 ක අක්කර බදු අයකර ගත යුතුව තිබුණ ද, වර්ෂය තුළ අය කරගෙන තිබුණේ රු.50 ක් පමණි.

### 2.3.2 බදු කුලී

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට වූ හිඟ ශේෂය දෙසැම්බර් 31 දින වනවිට රු.608,879 ක් දක්වා සියයට 20 ක් ඉක්ම වූ ප්‍රතිශතයකින් වැඩි වී තිබුණි.

**2.3.3** **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.817,569 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.37,957,746 ක මුදලක් ලැබිය යුතුව තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) නියමිත පරිදි සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක මුදල් නොයැවීම නිසා 2003 ජනවාරි මස සිට 2012 දෙසැම්බර් මස දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.140,457 ක අධිභාර මුදල් ගෙවීමට සිදු වී තිබුණු නමුත්, ඊට වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 156(1) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2011 පෙබරවාරි 24 දිනැති අංක 02/2011 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 4.1 ඡේදය ප්‍රකාරව අනියම් හා තාවකාලික පදනමින් බඳවා ගත් සියලුම සේවකයින් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක වියයුතු වුවද, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

**3.2** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

-------------------------------------

**3.2.1** **අය නොවී පවතින ණය ශේෂ**

--------------------------------

(i) සේවකයින් 10 දෙනෙකුගෙන් අයවිය යුතු රු.384,316 ක ණය ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන් 08 දෙනෙකු විසින් ලබාගෙන තිබුණු රු.283,515 ක යතුරුපැදි ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.2.2** **කාර්ය මණ්ඩල කළමනාකරණය**

--------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) ද්විතීයික මට්ටමේ 06 දෙනෙකුගේ සහ ප්‍රාථමික මට්ටමේ 13 දෙනෙකුගේ සහ අනියම් හා ආදේශක 11 දෙනෙකුගේ අතිරික්තයක් පැවතිය ද එම තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) ද්විතියික සේවක වර්ගයේ කළමනාකරණ සහකාර තනතුරු 03 ක, ආදායම් පරීක්ෂක තනතුරක සහ පුස්තකාලයාධිපති තනතුරක පුරප්පාඩු පැවති නමුත්, එම පුරප්පාඩු පුරවා ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

3.2.3 ඉඩම් අනුබෙදුම් කිරීම

------------------------

අක්කර 15 යි, රූඩ් 02 යි, පර්චස් 9.27 ක් විශාල වූ ඉඩම අංක 383/2013 දරන පිඹුරු පත මඟින් කැබලි 187 කට බෙදා වෙන්කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කෙරේ.

(i) 1992 සැප්තැම්බර් 30 දිනැති අංක 3/2/1/10(ii) දරන නාගරික සංවර්ධන අධිකාරියේ චක්‍රලේඛය ප්‍රකාරව සභාවට ලබා දී තිබූ ඉඩම් කොටස් සඳහා ඔප්පුවක් ලබාගෙන නොතිබුණි.

(ii) සැලසුම් කමිටුවේ කොන්දේසි ප්‍රකාරව ඉඩම් කැබලි කර නොතිබුණු අතර, සභා අනුමැතිය ලබා නොගෙන නිවාස ඉදිකර තිබුණි.

(iii) ඉඩම් කැබැලි කිරීමට අදාළව සභාව විසින් ලබා දී තිබුණු කොන්දේසි 07 ක් ඉටුකර නොතිබුණි.

3.2.4 වාහන පාලනය

------------------

සභාවට අයත් වාහන 13 ක් සඳහා ආදායම් බලපත්‍රද, එක් වාහනයක් සඳහා රක්ෂණාවරණයක් ද ලබාගෙන නොතිබූ අතර, වාහන 17 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි.

3.3 අවිධිමත් ගනුදෙනු

---------------------

(අ) පුහුණු වැඩමුළුවක් සඳහා 2015 මාර්තු 27 දින රු.220,000 ක් ගෙවීම් කර තිබුණද, ගෙවීමට අදාල, සභාවේ අනුමැතිය, බිල්පත් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තියට අනුකූල නොවන පරිදි සභා අරමුදලින් රු.77,000 ක උත්සව වියදම් දරා තිබුණි.

3.4 ව්‍යාපෘති ප්‍රමාද කිරීම

----------------------

සමලෝචිත වර්ෂය සඳහා අනුමැතිය ලැබී තිබුණු එකතුව රු.1,570,303 ක ඇස්තමේන්තුගත ව්‍යාපෘති 03 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

3.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

කසළ ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතියක් වෙනුවෙන් රුපියල් මිලියන 03 ක් අනුමත කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි. එසේම ව්‍යාපෘතිය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ පිළිසරු ව්‍යාපෘතිය මඟින් 2011 වර්ෂයේ ලබා දී තිබුණු උපකරණ ද කිසිදු ප්‍රයෝජනයකට නොගැනීම නිසා සභා භූමිය තුළ දිරාපත් වෙමින් පැවතුණි.

**4.** **යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

---------------------------------------

**4.1** **අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයක රු.821,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයද, තවත් වියදම් විෂයයක සීමාව ඉක්ම වූ රු.6,139,046 ක වියදම්ද, ආදායම් විෂයයන් 06 ක ලභාකර නොගත් ඉලක්කගත ආදායම් රු.22,570,754 ක්ද පැවතීම නිසා අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**4.2** **අභ්‍යන්තර විගණනය**

------------------------

2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/ න.ව.ලේ දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය පරිදි කළමනාකරණයට වගකියනු ලබන ස්වාධීන පුද්ගලයකු අභ්‍යන්තර විගණකවරයකු ලෙස පත් කර නොතිබුණි.

**4.3** **වත්කම් කළමනාකරණය**

----------------------------

**(අ)** **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

------------------------------------------

(i) ධාවනයෙන් ඉවත් කර, සභා භූමියේ ගාල්කර ඇති වාහන 05 ක් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට හෝ පියවර ගෙන නොතිබුණි.

(ii) පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු ගැල්වනයිස් (GI PIPE) බට 616 න් බට 88 ක් පිළිබඳ තොරතුරු විගණනයට අනාවරණය නොකෙරුණි.

**(ආ)** **පවරා නොගත් වත්කම්**

--------------------------

සභාව විසින් පරිහරණය කරන වාහන 11 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

**4.4** **නොවිසඳී ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්**

--------------------------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2010 සහ 2011 යන වර්ෂවල නිකුත් කරන ලද විගණන විමසුම් 12 ක් සඳහා පිළිගත හැකි පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, ඒ පිළිබඳව කරන ලද නැවත විමසීම් වලට 2016 ජුනි 30 වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 2.2.2 ඡේදයේ (අ), (ආ), (ඇ), (ඊ) හා (උ) යන ඡේද මඟින් පෙන්වා දෙන ලද අඩුපාඩු නිවැරදි කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

**5.** **පද්ධති හා පාලනය**

**-------------------**

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) මානව සම්පත් කළමනාකරණය
(ඉ) වාහන පාලනය